## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2015

---------------------------------------------------------

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

**2.1.1 සමූහය**

--------

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.2 කාර්යාංශය**

-------------

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය**

-----------------------------------------------

**2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

----------------------------

1996 අප්‍රේල් 18 දිනැති සංදේශය අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 96/1019/107/028 මගින් 1996 ඔක්තෝබර් 06 දින අනුදත් ප්‍රාග්ධනය වූ රු.මිලියන 100 ක් සහිතව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති නියෝජිත (පෞද්ගලික) සමාගම, සංස්ථාපනය කර තිබූ අතර නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වූ රු.5,000,040 න් රු.මිලියන 5 ක් කාර්යාංශයේ ආයෝජනයක් වශයෙන් ලබාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15(ඉ) වගන්තිය ප්‍රකාරව කාර්යාංශයට ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීමට බලය ලැබී තිබියදී එකී අරමුණ ඉටුකිරීම සඳහාම පරිපාලිත සමාගමක් පිහිටුවා තිබුණි. එලෙස එකම අරමුණ උදෙසා කාර්යාංශයට අමතරව සමාගමක් පිහිටුවීමේ අවශ්‍යතාවය විගණනයට ගැටළු සහගත වේ.

(ආ) 2008 වර්ෂයේ සිට 2013 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව පරිපාලිත සමාගමෙන් ලැබිය යුතු රු.3,510,033 ක ලාභාංශය කාර්යාංශය වෙත ලබාගැනීමකින් තොරව එම සමාගමේ සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණි.

(ඇ) 2012 අගෝස්තු 14 හා 2014 පෙබරවාරි 07 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී කාර්යාංශය විසින් පුද්ගලික සමාගම වෙත රු.මිලියන 20 ක ණය මුදල් ලබා දීම පිළිබඳ විමසුමට ලක් වී තිබියදී නැවත වතාවක් කාර්යාංශය විසින් පුද්ගලික සමාගමට රු.මිලියන 20 ක ණය මුදලක් ලබාදීම විගණනයට ගැටළු සහගත විය.

**2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු**

2014 අගෝස්තු මාසයේ දී කාර්යාංශය මගින් පරිපාලිත සමාගම වෙත ලබා දී තිබූ රු.මිලියන 20 ක ණය මුදල එකඟ වූ ගිවිසුම ප්‍රකාරව ගෙවා නොතිබුණු අතර 2016 ජනවාරි 20 දිනැති සමාගමේ සභාපතිගේ ලිපියට අනුව මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් තවදුරටත් ගෙවිය යුතු රු.9,000,000 ක මුදල සියයට 05 ක පොළියට මාසිකව රු.250,000 ක් බැගින් වාරික 36 කින් ගෙවීමට එකඟතාවයක් ඇති කරගෙන තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ඒජන්සියෙන් තවදුරටත් ලැබිය යුතු ණය ශේෂය රු.9,153,340 ක් ලෙස අවසන් ගිණුම් අනුව දක්වා තිබුණද එකී ගනුදෙනුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

**2. 3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - කාර්යාංශය**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

දේපල උපකරණ හා පිරියත යටතේ දක්වා තිබූ සේවක සුභසාධන අරමුදලට අයත් වත්කම් වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් කරුණු හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේ දී ගැටළු සහගත විය.

(i) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වත්කම් විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහය රු.956,209 ක් වැඩියෙන් හා ලැබුණු පොලී රු.409,589 ක් සහ ආයෝජන ආදායම් රු.47,099,267 ක් අඩුවෙන් ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයට ගැලපුම් කර තිබුණි.

(ii) විලම්භිත රාජ්‍ය ආධාර හා ප්‍රදානවලට අදාල ක්‍රමක්ෂය රු.666,058 ක්, බොල් ණය රු.2,992,868 ක්, මූල්‍ය ගාස්තු රු.1,633,422 ක්, පාරිතෝෂික වෙන්කිරීම් රු.4,993,117 ක් සහ පොලී රු.563,698 ක් මෙහෙයුම් ලාභයට ගලපා නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ කල්පිරුණු භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය සඳහා වන සම්පූර්ණ අධිමිල හෝ වට්ටම කල්පිරුණු අවස්ථාවේ දී එකවර ආයෝජන අගයට හා ආදායමට ගලපා තිබූ අතර ඒ සම්බන්ධයෙන් වන පෙර වර්ෂ ගැලපීම් සම්බන්ධයෙන් ප්‍රමිතයට අනුව කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**

විලම්භිත බදු වත්කම් හෝ බැරකම් සහ ප්‍රධාන බදු ආදායම් වියදම් සම්බන්ධයෙන් අවශ්‍ය හඳුනාගැනීම් සහ හෙළිදරව් කිරීම් කාර්යාංශය විසින් සිදුකර නොතිබුණු අතර බදු ආදායම් වියදම් සහ ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාවය ද, උපයෝගී කරගත් බදු අනුපාතය සම්බන්ධයෙන්ද පැහැදිලි කිරීම් සිදු කර නොතිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

---

(i) කාර්යාංශය විසින් විගමණික පුහුණු මධ්‍යස්ථානයක් හෝමාගම ස්ථාපිත කිරීමට ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2010 වර්ෂයේ දී රු.26,000,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. 2015 වර්ෂය අවසාන වන තෙක් මෙම ඉඩමේ භෞතික අයිතිය කාර්යාංශයට පවරාගෙන නොතිබුණු අතර තවදුරටත් රු.26,000,000 ක් ගෙවිය යුතුව තිබුණි. අත්තිකාරම් මුදල් පමණක් ගෙවා තිබූ මෙම ඉඩම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට පටහැනිව දේපල පිරියත උපකරණ යටතේ දක්වා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.520,000 ක් ක්ෂය කර තිබුණි. තවද ප්‍රමිතය ප්‍රකාරව ගිවිසුම්ගත බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවද මේ සම්බන්ධයෙන් එවැනි හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ii) දේපල පිරියත උපකරණ ක්ෂය කිරීමේ දී වාර්ෂිකව වත්කම්වල ඵලදායී ජීව කාලය සමාලෝචනය කර ඒ අනුව ක්ෂය ක්‍රමය හා ක්ෂය අනුපාත වෙනස් කල යුතු වුවත් වාර්ෂිකව එවැනි ඇස්තමේන්තුවක් සිදු කර නොමැතිවීමෙන් පිරිවැය රු.130,881,482 ක වත්කම්වල ශුද්ධ අගය ඉතා අඩු වටිනාකමකට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii) වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවත් ඊට පටහැනිව කාර්යාංශය විසින් වත්කම් ක්ෂය කිරීමේ දී මිලදී ගත් දිනය නොසලකා වර්ෂය සඳහාම ක්ෂය කර තිබුණි.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

---

කාර්යාංශය විසින් රු.148,224,223 ක් වටිනා පාරිතෝෂික වගකීම මත ආයෝජන සම්බන්ධයෙන් සාධාරණ අගය ගැලපීමක් සිදු කර නොතිබුණි.

**(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20**

---

රාජ්‍ය ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය, ප්‍රදානයේ ස්වභාවය හා ප්‍රමාණය සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36**

---

වත්කම් හානිකරණය යටතේ අගයන් සංසන්දනය කිරීමක් හෝ ගැලපීමක් සිදුකර නොතිබුණි.

**(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

---

මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.10,544,625 ක අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව ක්‍රමක්ෂය කිරීම හෝ හායනය කිරීමක් සිදුකර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

**(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39**

---

(i) කාර්යාංශය විසින් උපචිත පොළියක් සමඟ භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගන්නා අවස්ථා වලදී අදාල උපචිත පොළිය ලැබිය යුතු පොළියක් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර ආයෝජන පිරිවැය වශයෙන් හඳුනාගෙන තිබුණි.

(ii) ආයෝජන අගය ක්‍රමක්ෂය කරන ලද අගයට (Amortized Cost)දක්වා නොතිබුණි.

**2.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඕමාන් තානාපති කාර්යාල ගොඩනැගිල්ල සඳහා 2013, 2014 සහ සමාලෝචිත වර්ෂයට අදාලව රු.71,732,940 ක් ක්ෂය කර නොතිබුණි.

(ආ) විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ ඕමාන් තානාපති කාර්යාලයේ ගොඩනැගිලි සඳහා අයවිය යුතු රු.15,298,560 ක කුළී ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) නියැදි පරීක්ෂාවට අනුව විදේශ දූත මණ්ඩලවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු රු.9,983,493 ක වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන තිබූ තංගල්ල දිස්ත්‍රික් කාර්යාලීය ඉඩම සඳහා, ගිවිසුම ප්‍රකාරව 2013 නොවැම්බර් 08 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වාර මුදල් හා බදු මුදල් ලෙස රු.26,040,000 ක් ගෙවිය යුතුව තිබුණද එකී මුදල් සම්බන්ධයෙන් කිසිදු වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඉ) දිගු කාලීන බැරකමක් ලෙස දැක්විය යුතු රු.3,213,918,952 ක් වූ කුවේට් වන්දි අරමුදල් ශේෂය ප්‍රාග්ධන සංචිතයක් ලෙස දක්වා තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට විදේශ රැකියා ඒජන්සිය වෙත ගෙවිය යුතු රු.1,476,499 ක් සහ විදේශ රැකියා ඒජන්සියෙන් ලැබිය යුතු රු.11,767 ක් කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.374,771 ක දුරකථන බිල්පත් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණද එකී ගිණුමට ගැලපීම් කර නොතිබුණි.

(ඌ) ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය රු.945,540 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම් රු.4,993,117 ක් සඳහා පාරිතෝෂික ආයෝජන ගිණුමට ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඒ) කාර්යාංශය විසින් ආයුගණක තක්සේරුව මත ගණනය කරන ලද වර්තමාන සේවක පිරිවැය සහ පොළී පිරිවැය එකතුව රු.4,993,117 ක් වැඩියෙන් ආදායම් ප්‍රකාශයට ගලපා තිබුණි.

(ඔ) විලම්භිත ප්‍රදානයෙන් රු.111,533 ක් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගත යුතු වුවත්, ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ එය රු.666,058 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ලාභය රු.554,525 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ගිණුම්කරණ මෘදුකාංගයේ මූලිකව දරන වියදම් අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් එම වත්කම් රු.13,580,375 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.3.3 පැහැදිලි නොකල වෙනස්කම්**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට කුවේට් වන්දි සංචිතය හා එහි වත්කම් අතර රු.105,202,595 ක වෙනසක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන හා ඒ සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව වත්කම් ගිණුම් 06 ක, වගකීම් ගිණුම් 02 ක සහ වියදම් ගිණුමක පිළිවෙලින් රු.26,101,447 ක් හා රු.2,456,125 ක සහ රු.22,136,639 ක වෙනස්කම් වූ අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යාංශයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම සම්බන්ධයෙන් නියැදි විගණනයේ දී සිදු කරන ලද ගණනය කිරීම් සහ කාර්යාංශයේ ගණනය කිරීම් අතර පහත වෙනස්කම් පැවතුණි.

| විස්තරය | උපලේඛන අනුව විගණනයේ ගණනය කිරීම් | කාර්යාංශයේ ගණනය කිරීම් | මූල්‍ය ප්‍රකාශන සඳහා වන බලපෑම |
|---|---|---|---|
| ------------- | ---------------------- | -------------------- | ------------------------ |
| | රු. | රු. | රු. |
| ස්ථාවර තැන්පතු පොළිය - 2015 (NSB, BOC, Samurdi) | 28,884,060 | 28,452,889 | 431,171 |
| ස්ථාවර තැන්පතු ලැබිය යුතු පොළිය (NSB, BOC, Samurdi) | 14,920,102 | 14,466,948 | 453,154 |
| ස්ථාවර තැන්පතු ලැබිය යුතු පොළිය (SMIB) | 1,621,073 | 1,734,069 | 112,996 |

### 2.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය .

| ගිණුම් විෂයය | ශේෂය | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ------------ | -------- | ---------------------------- |
| | රු. | |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් ගාස්තු | 812,328 | උපලේඛන හා තහවුරු කිරීම් ලේඛන |
| රක්ෂණ වන්දි | 2,006,745 | |
| කොරියන් වීසා තැන්පතු ගාස්තු | 31,524,662 | |
| කොරියන් ටිකට් තැන්පතු ගාස්තු | 124,121,275 | |
| විවිධ ණය හිමියෝ | 1,587,599 | |
| කුවේට් රක්ෂණ වන්දි තැන්පතු | 15,460 | |
| හොර ජාවාරම් වැලැක්වීමේ ව්‍යාපෘතිය | 554,111 | |
| ආහාර සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 16,952,941 | |
| කොරියාවට නැවත පිටත්වීමේ ගාස්තු | 1,542,535 | |
| විදේශ දූත මණ්ඩලවල ආරක්ෂණ ගාස්තු | 32,411,265 | |
| නැවත ගෙන්වා ගැනීමේ ගාස්තු | 11,536,835 | |
| අයකර ගත යුතු දුරකථන ගාස්තු | 2,126,675 | |
| | ---------------- | |
| | 225,192,431 | |
| | ========== | |

### 2.3.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 9.7 වගන්තිය ප්‍රකාර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් කාර්යාංශ නිලධාරීන් සඳහා රු.84,371,445 ක විවිධ දීමනා ගෙවා තිබුණි.

(ආ) ජපාන කම්කරු සුභසාධන අංශය සඳහා කම්කරු සුභසාධන නිලධාරී තනතුරක් අනුමත කර නොතිබුණු අතර 2012 වර්ෂයේ සිට 2015 මැයි දක්වා අනුමත නොවූ තනතුරක් සඳහා එකතුව රු.11,169,507 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ජපාන දූත මණ්ඩල වියදම් සාරාංශ වාර්තා අනුව 2015 මැයි මාසය අවසානයේදී එම පත් කිරීම අවසන් කර තිබූ අතර රු.277,132 ක මුදල් ශේෂය නැවත කාර්යාංශයේ බැංකු ගිණුමට 2016 අගෝස්තු 31 දින වන විටත් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2/2015 දරන චක්‍රලේඛයට පටහැනිව මාසික ජංගම දුරකථන ගාස්තු නිරවුල් කිරීමේ දී 2015 ජූනි 01 දින සිට එකතුව රු.588,842 ක බදු මුදල් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගමනිකයින්ගේ පැමිණිලි/ආරාවුල් සමථයකට පත්කර ගැනීම සඳහා නියෝජිත ආයතන විසින් තැන්පත් කර වසර 6 ඉක්මවා තිබූ එකතුව රු.9,980,554 ක ශේෂය නිරවුල් කිරීමට 2016 ජූනි වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් කාර්යාංශය විසින් පවත්වාගෙන ගොස් තිබූ අර්ථ සාධක අරමුදල් යෝජනා ක්‍රමය වර්තමානයේ අක්‍රීයව පැවතිය ද විගමනිකයින් 1620 කට අදාලව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්යාංශය විසින් රඳවා ගෙන තිබූ රු.7,068,901 ක දායක මුදල මුදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1990 වර්ෂයේ දී ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීමෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබී ඉතිරිව තිබූ රු.3,213,918,952 ක් අදාල ශ්‍රමිකයින් වෙත ගෙවා අවසන් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) විගමණික ශ්‍රමිකයින් සඳහා වන්දි ගෙවීම වෙනුවෙන් 2013 හා 2014 වර්ෂවල දී පරිපාලිත සමාගම වෙත ලැබී තිබූ රු.2,884,020 ක රක්ෂණ වන්දි අදාල වන්දි හිමියන්ට නිදහස් කිරීම සඳහා කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විදේශ දූත මණ්ඩල සුභසාධන අංශ විසින් අයකර භාණ්ඩාගාරය හරහා කාර්යාංශයට ප්‍රේෂණ කරනු ලැබූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු වලින් රු.1,010,548,646 ක් තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබුණි.

(ඊ) වසර 02 ඉක්මවා තිබූ එකතුව රු.1,554,566 ක් වූ ටෙන්ඩර් තැන්පතු සහ රු.12,318,067 ක් වූ රැඳවුම් මුදල් නියමිත හිමිකරුවන් වෙත ආපසු ගෙවීමට හෝ මු.රෙ.572 (2) ප්‍රකාරව කාර්යාංශයේ ආදායමට ගෙන එම ගිණුම් නිරවුල් කිරීමට 2016 ජූනි දක්වාම කටයුතු කර නොතිබුණි.

(උ) විදේශ රැකියා නියෝජිත ආයතන 96 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගත යුතුව පැවති රු.944,500 ක සෙස් බදු 2016 ජූනි වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංවර්ධන නිලධාරීන්ගේ දූරකථන බිල්පත් නිරවුල් කිරීමට අදාලව විදේශ රැකියා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.4,660,315 ක් අයවී නොතිබුණි.

(එ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගුවන් තොටුපල ඒකකය මගින් කාර්යාංශ ලියාපදිංචිය ලබා ගැනීමේ දී අයවිය යුතු සම්පූර්ණ ගාස්තුව නොගෙවූ විගමණිකයන්ගෙන් ලැබිය යුතු රු.670,780 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) සේවය අත්හිටුවා තිබූ නිලධාරීන් 07 දෙනෙකුට අදාලව එකතුව රු.1,473,381 ක් වූ ණය ශේෂ 2010 වර්ෂයේ සිට අය නොවී පැවතුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| (i) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය | කාර්යාංශය විසින් අර්ථසාධක අරමුදල් දායකත්වය ගණනය කිරීමේ දී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් පරීක්ෂා කරන ලද නියැදියට අනුව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා එකතුව රු.21,607,947 ක දායක මුදල් අඩුවෙන් ගණනය කර ප්‍රේෂණය කර තිබුණි. |
| (ii) 1982 අංක 12 දරන පාරිතෝෂික පනතෙහි 6(2) වගන්තිය | සේවයෙන් ඉවත්ව යන සේවකයෙකුට සේවය අවසන් කළ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවිය යුතු වුවද, නිලධාරීන් 10 දෙනෙකුට අදාලව ඒ අනුව ගෙවීම් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය | |
| **(i)** 3.5 වගන්තිය | නිලධාරීන් 04 දෙනෙකු වෙත සියයට 40 සීමාව ඉක්මවා වැටුප් ණය ලබා දී තිබුණි. |
| (ii) 3.7 වගන්තිය | ණය මුදල ගෙවන ලද දිනයේ සිට නියමිත ප්‍රමාණයට පොලිය අයකර නොගැනීම හේතුවෙන් රු.279,357 ක පොළී ආදායමක් අහිමි වී තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------------------------

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත් 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලබා දී තිබු රු.8,534,350 ක අත්තිකාරම් විගණන දිනය වු 2016 අගෝස්තු 26 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 770 | 2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව අබලි ද්‍රව්‍ය භාණ්ඩ ඒකක 223 ක් සහ 2015 වර්ෂයේදී හඳුනාගත් රු.1,321,160 ක් වටිනා යල්පැන ගිය භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ඈ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

--------------------------

| | |
|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන චක්‍රලේඛයේ 4.2.3 ඡේදය | කාර්යාංශය විසින් තම පරිපාලිත සමාගමේ කාර්යසාධනය අවම වශයෙන් මාස 06 කට වරක්වත් සාකච්ඡා කිරීම, අර්ධ වාර්ෂික කාර්යසාධන වාර්තා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතට ලබා දීම හා ලාභය පදනම් වු ලාභාංශ නිවැරදිව ලබා ගැනීමට කටයුතු කිරීම සහ අනෙකුත් ආයෝජන කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණ කිරීම සිදුකළ යුතු වුවත් එම කරුණු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |
| (ii) 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී/ 50 හා 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන චක්‍රලේඛ | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරීන් 15 දෙනෙකුට රු.912,876 ක අතිරේක ඉන්ධන සඳහා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/2015/43 දරන මැතිවරණ කොමසාරිස්ගේ ලිපියේ ඡේද අංක 08 | මැතිවරණ කාල සීමාව තුළ බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල රටවිරු සංවිධාන වැඩසටහන් සඳහා කුලී පදනම මත වාහන ලබා ගැනීම වෙනුවෙන් රු.627,984 ක් ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

**----------------------**

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ සහ කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.356,598,859 ක් සහ රු.355,700,950 ක ලාභයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.450,821,256 ක් සහ රු.413,934,370 ක ලාභයක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.94,222,397 කින් සහ රු.58,233,420 කින් පිරිහී තිබුණි. ඉහත පිරිහීම සඳහා ආදායම් බදු ගැලපීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 කාර්යාංශයට එරෙහිව හෝ කාර්යාංශය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි.**

---

බාහිර පාර්ශවයන් හා කාර්යාංශ නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කාර්යාංශයට එරෙහිව නඩු 29 ක් ගොනු කර තිබූ අතර නඩු 05 ක් සඳහා කාර්යාංශය විසින් රු.375,290 ක් අසම්භාව්‍ය බැරකමක් ලෙස හඳුනාගෙන තිබුණි. එමෙන්ම කාර්යාංශයට එරෙහිව පැවරූ නඩු සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 95 සිට සියයට 115 දක්වා වැඩි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කාර්යසාධනය**

---

කාර්යාංශ පනතේ 15 වන වගන්තියට අනුව එතෙර රැකියා අවස්ථා නංවාලීම හා සංවර්ධනය කිරීම, බලපත්‍රලාභී නියෝජිත ආයතනවල කටයුතු නියාමනය කිරීම හා ඒවාට පහසුකම් සැපයීම සහ විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත ආරක්ෂාව හා සුබසාධනය සැලසීම කාර්යාංශයේ ප්‍රධාන අරමුණු වේ.

(අ) ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව පරීක්ෂා කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නියෝජිත ආයතන බඳවාගැනීමේ ගාස්තු 2014 වර්ෂයේ රු.527,321,250 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී රු.285,109,500 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 46 කින් අඩු වී තිබුණි.

(ii) පසුගිය වර්ෂයට සාපේක්ෂව විදේශ රැකියා ඇණවුම් සම්බන්ධ කාර්යයන්වල පහත වැටීමක් සිදුවී තිබුණි. විස්තර පහත දැක් වේ.

| විස්තරය | වර්ෂය 2015 | 2014 | අඩුවීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| විදේශ රැකියා ඇණවුම් සඳහා අනුමැතිය ලබාදීම | 5632 | 6184 | 9 |
| ආයතනවලට මාධ්‍ය දැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම | 2756 | 3232 | 15 |
| විදේශ රැකියා ඇණවුම් සඳහා අනුමැතීන් දීර්ඝ කිරීම | 1802 | 3274 | 45 |

(iii) බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන වෙත ලැබෙන විදේශ රැකියා ඇබෑර්තු සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ 343,626 ක් හා පසුගිය වර්ෂයේ 356,318 ක් වූ අතර ලැබෙන විදේශ රැකියා ඇබෑර්තු සංඛ්‍යාව සියයට 3.6 කින් පහත වැටී තිබුණි. මේ අනුව විදේශ රැකියා කටයුතු සම්බන්ධව මෙරටට පැමිණි සහ මෙරටින් යවන ලද දූත මණ්ඩල නියෝජිතයන් වෙනුවෙන් 2015 වර්ෂයේ දී රු.මිලියන 21.34 ක් වැයකර තිබුණ නමුත් එහි ප්‍රතිලාභ උපරිම අයුරින් මෙරටට අත්පත් කරගෙන තිබුණේදැයි විගණනයට ගැටළු සහගත විය.

(iv) බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන හරහා ශ්‍රමිකයින් විදේශගතවීම් සමාලෝචිත වර්ෂයේ 117,532 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ 177,012 ක් වූයෙන් බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන හරහා විගමණික ශ්‍රමිකයින් විදේශගතවීම් සියයට 34 කින් අඩු වී තිබුණි.

(v) සමාලෝචිත වර්ෂයේ නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධයෙන් වැටලීම් සිදු කිරීම් 91 ක් වූ අතර ඉකුත් වර්ෂයේ වැටලීම් 138 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැටලීම් ප්‍රමාණය සියයට 34 කින් පහත වැටී තිබුණි.මේ අනුව කාර්යාංශය විසින් නීතිවිරෝධී බඳවා ගැනීම් කෙරෙහි අවම අවධානයක් යොමු කර තිබීමෙන් වලංගු බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලී සිටින තැනැත්තන්ට විරුද්ධව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව 616 සිට 805 ක් දක්වා සියයට 31 කින් ඉහළ ගොස් තිබුණි.

(vi) මැදපෙරදිග නොවන රටවල රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා තිබූ අතර පුහුණුලාභීන් සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව පහත වැටී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේ රු.159,807,926 ක්ව තිබූ පුහුණු ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු.137,739,805 ක් දක්වා සියයට 14 කින් පහත වැටී තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂයේ දකුණු කොරියාවේ රැකියා අවස්ථා සඳහා රැකියා ගිවිසුම් 5992 ක් ලැබී තිබූ අතර එම අවස්ථාවන් සඳහා 4942 ක් පමණක් පිටත්ව ගොස් තිබුණි. ඒ අනුව 1050 දෙනෙකු සඳහා එනම් සියයට 17.5 ක් සඳහා රැකියා අවස්ථා තිබූ නමුත් එම රැකියා අවස්ථාවන් සඳහා ශ්‍රමිකයින් යැවීමේ ක්‍රමවේදයක් ඇති කරලීමට කාර්යාංශය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2015 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ විදේශයන්හි පිහිටි සුභසාධන අංශවල ආරක්ෂිත නිවාසයන් වෙත මැද පෙරදිග ගෘහ සේවයේදී මුහුණපාන විවිධ ගැටලු හා ප්‍රශ්න හේතුවෙන් කම්කරුවන් 1065 දෙනෙකු පැමිණ තිබුණි. ඉන් 832 දෙනෙකු විවිධ හිරිහැර මත පැමිණ තිබූ අතර ඉන් 281 දෙනෙකු මාස 03 ට වඩා වැඩි කාලයක් ආරක්ෂක නිවාසවල රැඳී සිටි බවත් නිරීක්ෂණය විය. කාර්යාංශය විසින් විධිමත් පාලන ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් හා පුහුණුවීම් ලබාදීමෙන් පසුව රැකියා සඳහා යොමු නොකිරීම නිසා විදේශගත වූවන්ගෙන් සැළකිය යුතු පිරිසක් මෙලෙස නැවතත් කාර්යාංශයට වැය බරක් වෙමින් ආරක්ෂිත නිවාසයන්හි රැඳී සිටීම ගැටළුවක් වන අතර මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා කාර්යාංශයේ ක්‍රියාත්මක ක්‍රමවේදයන්ගේ හා පාලන විධික්‍රමයන්හි සාර්ථකත්වය පිළිබඳ විගණනයට ගැටළුකාරී විය. තවද කාර්යාංශයේ පනත ප්‍රකාරව ස්වකීය නියෝජිතයන් විසින් ඒ රටේ සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු වුවද මෙසේ හිරිහැර වී පැමිණෙන ලාංකිකයන් වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි අවධානය යොමු කර තිබේද යන්න සම්බන්ධයෙන් විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය.

(ඇ) සේවක සුභසාධන අරමුදල යටතේ සහ රක්ෂණ වැඩසටහන යටතේ ආරක්ෂිත නිවාසවල රැඳී සිටින විගමණිකයන් මෙරටට ගෙන්වා ගැනීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 59 කින් හා සියයට 89.9 කින් ද ඒ සඳහා යොදවන ලද මුදල පිළිවෙලින් සියයට 19.7 කින් හා සියයට 90 කින්ද අඩු වී තිබූ බව කාර්යසාධන වාර්තා පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව සමස්ථයක් ලෙස කාර්යාංශය විසින් ආරක්ෂිත නිවාසවල රඳවා ඇති විගමණිකයින් මෙරටට ගෙන්වා ගැනීමේ ක්‍රමවේදය ප්‍රශස්ථ මට්ටමේ පවතින්නේද යන්න විගණනයට ගැටළුකාරී විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දූත මණ්ඩලවල රැඳී සිටි විගමණිකයන් වෙනුවෙන් වැය කර ඇති වියදම් විශ්ලේෂණයේ දී විදේශ මුදල් රුපියලට පරිවර්තනික අගයන් සමාන වන අබුඩාබි, ඩුබායි, කටාර්, රියාද් යන දූත මණ්ඩලවල දැරූ වියදම් එක් විගමනිකයෙකු වෙනුවෙන් පිළිවෙලින් රු.27,745 ක් රු.61,653 ක් රු.7,365 ක් හා රු.86,344 ක් විය. ඒ අනුව එම වියදම් විශ්ලේෂණයේදී රියාද්වල එක් විගමණිකයෙකු වෙනුවෙන් දරන ලද වියදම්වල අසාමාන්‍ය තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ඉ) කාර්යාංශයේ සමථ අංශයේ කටයුතු පිළිබඳ පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලැබී තිබූ පැමිණිලි 2646 ක් අතුරින් පැමිණිලි 994 ක් හා 2015 මුල් අර්ධ වර්ෂය තුල ලැබී තිබූ පැමිණිලි 2910 න් පැමිණිලි 1867 ක් 2015 ජුනි 30 දින වන විටත් නොවිසඳී පැවතුණි.

(ii) නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද පැමිණිලි 500 ක් විසඳා ඇති ආකාරය අනුව පැමිණිලි 75 ක් පැමිණිලිකරු තවදුරටත් ක්‍රියාත්මක වීම අවශ්‍ය නොවන ලෙස දක්වා තිබූ අතර අවස්ථා 55 කදී පැමිණිලිකරු ලිපිගොනුව වසා දැමීමට එකඟ වී තිබුණි. ඒ අනුව ලිපිගොනු 130 ක පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය. නියැදියෙන් පැමිණිලි 204කට අදාලව විගමණිකයා නැවත ලංකාවට ගෙන්වා ගැනීම සිදු කර පැමිණිලි විසඳා තිබූ අතර විගමණික ශ්‍රමිකයාගේ ගැටළුවට පිළිතුර ආපසු ලංකාවට ගෙන්වා ගැනීම පමණක් ප්‍රමාණවත්වේද යන්න සම්බන්ධයෙන් විගණනයට සෑහීමට පත්විය නොහැකි විය.

(ඊ) කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද දත්තවලට අනුව විගමණික සේවක සුභ සාධනය සඳහා සමාලෝචිත වර්ෂයේ දී කරන ලද වියදම් සියයට 42 සිට සියයට 30 දක්වා ක්‍රමයෙන් අඩු වී තිබූ අතර කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැරූ සෘජු වියදම් සියයට 47 සිට සියයට 62 දක්වා වැඩිවී තිබුණි.

(උ) අවශ්‍යතාව හඳුනා ගැනීමකින් තොරව දිනපොත් මුද්‍රණය කිරීමෙන් පිරිවැය රු.1,163,337 ක් වූ සමාලෝචිත වර්ෂයේ කළමනාකරණ දින පොත් 1898 ක් හා සාමාන්‍ය දින පොත් 2878 ක් ද, 2014 වර්ෂයේ කළමනාකරණ දිනපොත් 65 ක්ද ඉතිරි තොග තුළ ඇතුලත්ව තිබීම හේතුවෙන් එකී වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඌ) 2015 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවෙහි දැක්වෙන පරිදි වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රු.මිලියන 59.35 ක් වටිනාකමැති ව්‍යාපෘති 20 ක් හා වටිනාකම දක්වා නොමැති ව්‍යාපෘති 09 ක් ද සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ඉටුකර තිබූ කාර්යයන්වල ප්‍රගතිය සියයට 48 සිට සියයට 85 ක් අතර විය.

(එ) ශ්‍රී ලාංකිකයන් සඳහා වූ ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම කාර්යාංශයේ පරමාර්ථයක් වන අතර 2015 වර්ෂයේ කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ රැකියා අවස්ථා හිමිවන තෝරාගත් රටවල් වල විදේශීය නියෝජිතයන්, ව්‍යාපාර හිමිකරුවන් සමග රැකියා ප්‍රවර්ධන සාකච්ඡා පැවැත්වීමට ඇස්තමේන්තු කර තිබුණද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වූ සේවා නියුක්ති අවස්ථා පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු කිරීම රටවිරු පියස ව්‍යාපෘතිය තුලින් විගමණිකයන් සඳහා නිවාස ඉදිකිරීම හෝ ණය ලබා දීම සිදු කිරීමට 2015 ක්‍රියාකාරී සැලැස්ම තුලින් අපේක්ෂා කර ඇති නමුත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ මාස 06 ක කාලපරිච්ඡේදය තුළ කොරියානු රැකියාලාභීන් සඳහා වෛද්‍ය වාර්තා ලබා ගැනීමට යොමුකළ විගමණිකයින් 6260 න් 2931 ක් පමණක් ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථානය වෙත යොමු කර තිබූ අතර එය මුළු විගමණික සංඛ්‍යාවෙන් සියයට 47 ක් විය. ඉතිරි විගමණිකයන් වෙනත් රෝහල් වෙත යොමු කර තිබූ අතර කාර්යාංශයට අනුබද්ධිත වෛද්‍ය මධ්‍යස්ථාන වෙත යොමු නොකිරීමෙන් ලබාගත හැකිව තිබූ ආදායම අහිමි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සහ කාර්යාංශය අතර සහයෝගිතාවයෙන් සංක්‍රමණික සේවකයන් සඳහා ඒකාබද්ධ නිවාස ආධාර වැඩසටහනක් සහ යළි සමානුයෝජන වැඩසටහනක් සැලසුම් කොට ක්‍රියාත්මක කර තිබුණි.මෙමගින් සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලයින් 9103 දෙනෙකු වෙත රු.මිලියන 2648.11 ක ණය නිදහස් කොට තිබූ අතර ඒ අතුරින් පුද්ගලයින් 2500 දෙනෙකු විසින් රු.මිලියන 587.1 ක ණය එනම් සියයට 22 ක් ගෙවීම පැහැර හැර තිබුණි. එසේම 2015 ජුනි 30 දින වන විට නිකුත් කළ ණය මුදලෙන් සියයට 10 ක ප්‍රමාණයක් බොල් ණය බවට පත් වී තිබුණි. ඒ අනුව ණය අයකර ගැනීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවති බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) නිවාස යෝජනා ක්‍රමය සඳහා මුල්ගල් තැබූ සමහර ස්ථානයන් වල ඉඩම් අයිතිය තහවුරු නොවීමෙන් නිවාස ඉදිකිරීමට නොහැකි වීම නිසා නිවාස ඉදිකිරීම සම්බන්ධ ප්‍රාරම්භක සැලසුම්කරණය දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ii) 2015 ජනවාරි 01 දිනට කාර්යාංශයෙන් ලබා දුන් තොරතුරු අනුව පුද්ගලයින් 9450 කට නිවාස සෑදීම සඳහා ණය ලබා දී තිබුණ ද ඉන් වැඩ අවසන් මුළු නිවාස සංඛ්‍යාව 3412 ක් හෙවත් එනම් සියයට 36 ක් විය.

(iii) ගිවිසුම ප්‍රකාරව නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ණය නොගෙවීමෙන් හෝ වෙනත් අදාල ක්‍රියාකාරකමක් නිසා සමෘද්ධි අධිකාරියට සිදුවන පාඩුවක් හෝ වියදමක් වෙතොත් එය බෙදීයන ආකාරයෙන් ක්‍රියා කිරීමට කාර්යාංශය එකඟ වී තිබීම හේතුවෙන් කාර්යාංශ ඇප තැන්පතු මුදලෙන් හා ඊට අදාල පොලී මුදලින් එම පාඩුව පියවා ගැනීමට සිදුව තිබුණි.

(ඇ) සමාගමකට අයත් ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වූ ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රු. මිලියන 20 ක අත්තිකාරමක් සහ තංගල්ල, කහගොල්ල හා කුරුණෑගල ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු වෙනුවෙන් රු.මිලියන 309.6 ක් වැය කර තිබුණ නමුත් 2016 ඔක්තෝබර් මාසය වන විටත් එම ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගත වන ශ්‍රමිකයන් වෙනුවෙන් රක්ෂණ යෝජනා ක්‍රමයක් කාර්යාංශය විසින් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම සමඟ 2012 ජුනි 19 දින ආරම්භ කර තිබුණි. 2013 වර්ෂයේ සිට 2015 මාර්තු දක්වා ගිවිසුම් කාලය අවසන් වන තෙක් වාර්ෂිකව (බදු ඇතුළත්ව) රු.594,890,103 ක් කාර්යාංශය විසින් රක්ෂණ වාරික ලෙස ඒජන්සිය වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 සිට 2015 මාර්තු 28 දක්වා විවිධ දුෂ්කරතා හා කරදරවලට ලක්වීම මත ලංකාවට නැවත ගෙන්වනු ලැබූ විගමණිකයින් 514 දෙනෙකුට අදාලව කාර්යාංශය විසින් ගෙවා තිබූ එකතුව රු.13,355,054 ක ගුවන් ටිකට්පත් ගාස්තු ඒජන්සිය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර ඉන් 195 දෙනෙකුට අදාල රු.5,048,597 ක ගාස්තු ගෙවීම ඒජන්සිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii) ගිවිසුම ප්‍රකාරව විගමණිකයෙකුට දුෂ්කරතා හා කරදරවලට ලක්වී නැවත ලංකාවට ගෙන්වා ගැනීමේ දී දැරීමට සිදු වූ බදු ඇතුළත් සත්‍ය ගුවන් ටිකට්පත් ගාස්තුව සම්පූර්ණයෙන්ම ප්‍රතිපූර්ණය කර ගැනීමට හැකි වුවද සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී ඒජන්සිය විසින් විගමණිකයන් 140 දෙනෙකුට අදාල සම්පූර්ණ මුදලම ප්‍රතිපූර්ණය නොකිරීමෙන් කාර්යාංශයට රු.922,833 ක පාඩුවක් සිදු වී තිබුණි.

(iii) කාර්යාංශයේ වියදමින් විගමණිකයන් ලංකාවට ගෙන්වා ගනු ලැබුව ද ඇතැම් අවස්ථා වලදී විදේශ සබඳතා අංශය මගින් රක්ෂණ හිමිකම් සඳහා අයදුම් කිරීමට ප්‍රථම අදාල විගමණිකයා සුභසාධන අංශය වෙතින් රක්ෂණ හිමිකම සඳහා අයදුම්කර මුදල් ලබාගෙන ඇති බව නියැදි පරීක්ෂාවේ දී අනාවරණය විය. අංශ අතර මනා සබඳතාවයක් නොතිබීම හේතුවෙන් විගමණිකයන් 53 දෙනෙකු විසින් එසේ අයදුම්කර මුදල් ලබා ගැනීමෙන් කාර්යාංශයට රු.1,071,639 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ විදේශ ගතවන විගමණිකයකු යම් හේතුවක් මත මියගියහොත් ඔවුන්ගේ යැපෙන්නන්ට රු.400,000 ක වන්දි මුදලක් ලබා දීමට ගිවිසුමේ එකඟ වී තිබුණි. මේ පිළිබඳ නියැදි පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 සහ 2015 වර්ෂවල මියගිය විගමණිකයන් 281 දෙනෙකුගේ යැපෙන්නන් විසින් රක්ෂණ වන්දි සඳහා ඉල්ලුම් නොකලේ යැයි සඳහන් කරමින් ඔවුන්ට හිමි විය යුතු ආසන්න වශයෙන් එකතුව රු.112,400,000 ක වන්දි විධිමත් දැනුවත් කිරීමකින් තොරව යැපෙන්නන් වෙත නොගෙවා අතහැර දමා තිබුණි. තවද මිය ගිය විගමණිකයන් 46 දෙනෙකුගේ උරුමකරුවන් නීති අංශය විසින් තහවුරු කර තිබුණ ද ඔවුන් වෙත ගෙවිය යුතු එකතුව රු.18,400,000 ක් වූ වන්දි විගණිත දිනවූ 2016 ජනවාරි 19 දින වන විටත් ලබා දී නොතිබුණි. එසේම මිය ගිය විගමණිකයන් 42 දෙනෙකුගේ ලිපි ගොනු අඩුපාඩු සහිත ලිපි ගොනු ලෙස සඳහන් කර තිබු නමුත් මෙම අඩුපාඩු සමාගම හා කාර්යාංශය විසින් මැදිහත්ව නිරාකරණය කර යැපෙන්නන්ට රක්ෂණ වන්දි කඩිනමින් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ii) කාර්යාංශ පනත ප්‍රකාරව විගමණිකයෙකුගේ සුභසාධනය හා ආරක්ෂාව භාර ගැනීම කාර්යාංශයේ එක් පරමාර්ථයක් වූ අතර විගමණිකයන්ගේ යැපෙන්නන් වෙත අදාල රක්ෂණ වන්දි මුදල් ලබා ගැනීමට අවශ්‍ය සහය ලබා දීම හා වන්දි ලබා ගැනීමට පෙළඹවීම කාර්යාංශයේ වගකීමක් විය. එහෙත් බාහිර රක්ෂණ ආයතන එම රක්ෂණ මුදල් නියමිත පරිදි ලබා නොදීමෙන් ඔවුන්ගේ සුභසාධනය හා ආරක්ෂාව රැකෙන පරිදි කාර්යාංශය මැදිහත්ව කටයුතු කර ඇති බවට විගණනයට සෑහීමට පත් විය නොහැකි විය.

(ඇ) කාර්යාංශ පනතේ **II** කොටසේ 17 වන වගන්තියේ 3 වන උප වගන්තිය යටතේ කාර්යාංශ අරමුදලින් වියදම් කල යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබියදී ඊට පටහැනිව කාර්ය මණ්ඩලයේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හා හදිසි අනතුරු වන්දි ලබාදීමේ යෝජනා ක්‍රමයක් සඳහා යොදවා තිබු බව නිරීක්ෂණය විය. ඒ අනුව 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තියට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේ නිලධාරීන්ගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණයට රු.35,084,908 ක් වැය කර තිබුණි. කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගත වන විගමණිකයන්ගෙන් රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ගාස්තුවක් අයකරන නමුත් කාර්යාංශයේ නිලධාරීන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමයට කිසිදු දායක මුදලක් අයකර නොගැනීම විගණනයට ගැටළුකාරී විය. සමාලෝචිත වර්ෂයේ දී කාර්යාංශ සේවක නිලධාරීන්ගේ හා විගමණිකයන්ගේ පිළිවෙලින් රු.35,070,123 ක් හා රු.1,190,000 ක වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණය කර තිබු අතර වර්ෂයේ සමස්ත වෛද්‍ය බිල්පත් වියදමින් විගමණිකයන්ගේ ප්‍රමාණය සියයට 3 ක් විය.

(ඈ) ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 2.1 ඡේදය ශ්‍රී ලංකා විදේශ සේවයේ සාමාජිකයන් හා එතෙර දූත - මණ්ඩල කාර්යාලයන්හි රාජ්‍ය තාන්ත්‍රික නිලයන් දරන්නා වූ ශ්‍රී ලංකා විදේශ සේවයේ නොවන සියළුම නිලධාරීන් විෂයෙහි ද බල පැවැත්වෙන නමුත් ඊට පටහැනිව කාර්යාංශය විසින් විදේශ දූත මණ්ඩල සේවයට අනුයුක්ත කර ඇති නිලධාරීන් සඳහා පහත සඳහන් පරිදි ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

(i) විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සිය රට පේරුවේ පදනම මත (HomeBased) නේවාසික කාර්ය මණ්ඩලය සඳහා පමණක් ශ්‍රී ලංකාවේ එම නිලධාරීන්ගේ නිත්‍ය තනතුරට හිමි මාසික ඒකාබද්ධ වැටුප (දීමනා රහිත) ඇමරිකානු ඩොලර් වලට පරිවර්තනය කර ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව එකී නිලධාරීන් වෙත සියළු දීමනා සහිත සම්පූර්ණ වැටුප රුපියල් වලින් ලබා දී තිබුණි.

(ii) දූත මණ්ඩල පිහිටි රටෙන් බඳවා ගන්නා පදනම මත (Local Based) ශ්‍රී ලංකාවෙන් යවනු ලබන නිලධාරීන් සඳහා ශ්‍රී ලංකාවේ ඔවුන් යෙදුණු තනතුර වෙනුවෙන් වැටුප් ගෙවීමක් සිදු කරනු නොලබනු අතර ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 16 උප පරිච්ඡේදය ප්‍රකාර රැකියාවට ස්ව වියදමින් විදේශගත විය යුතු අතර අදාල රටෙහි සේවයේ යෙදීම වෙනුවෙන් හිමිවන වැටුප පමණක් උක්ත නිලධාරීන්ට හිමි වේ. නමුත් ඊට පටහැනිව 2013 නොවැම්බර් 14 දිනැති 163/2013 (M-11) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් වර්ෂ අවසාන වාර්ෂික ප්‍රසාද දීමනා , මාසික වැටුප , යාමට ඒමට ගුවන් ටිකට්පත් හා විදේශ දූත මණ්ඩල කාර්යාලයේ සේවය කරන කාලයට අදාල වෛද්‍ය පහසුකම් ලබා දී තිබුණි.

(iii) විදේශ දූත මණ්ඩලවල කම්කරු අංශයන්හි සිය රට පේරුවේ පදනම මත (Home Based) සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා මාසයකට ඇ.ඩො.200 බැගින් සහ පිහිටි රටින් බඳවා ගන්නා පදනම මත (Local Based) සේවයේ යෙදෙන නිලධාරීන් සඳහා මාසයකට ඇ.ඩො.150 බැගින් වන විශේෂ ජීවන වියදම් දීමනාවක් 2013 පෙබරවාරි 21 සිට කාර්යාංශය මගින් ගෙවා තිබුණි. මීට අමතරව 2014 අප්‍රේල් 01 දින සිට කාර්ය මණ්ඩලය සඳහා ගෙවා තිබූ ඇ.ඩො.300 ක නවාතැන් දීමනා සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 17 දිනැති අංක ඩීඑම්එස්/0066/විඔඑල් I දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් එකඟතාවය ලබා දී නොතිබුණි.

(ඉ) 2012 අගෝස්තු මාසයේ සිට 2015 මාර්තු දක්වා විගමණික රක්ෂණ කටයුතු වෙනුවෙන් පරිපාලිත සමාගම විසින් රු.39,402,347 ක අතිරික්තයක් උපයා තිබුණි. තවද රක්ෂණ නියෝජිත ලෙස කටයුතු කිරීම වෙනුවෙන් රක්ෂණ සංස්ථාවෙන් ලබාගන්නා සියයට 10 ක කොමිස් වශයෙන් 2013 දෙසැම්බර් සිට 2015 මාර්තු දක්වා ඒජන්සිය විසින් රු.51,889,091 ක් රක්ෂණ සංස්ථාවෙන් නැවත ලබාගෙන තිබුණි. ඒ අනුව කාර්යාංශය විසින් එම ක්‍රියාකාරකම් ඉටු නොකිරීම හේතුවෙන් ඉහත ප්‍රකාරව රු.91,291,438 ක ආදායමක් කාර්යාංශයට අහිමි වී තිබුණි.

(ඊ) විදේශගතවීම ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කළ හැකි මුහුණත වටිනාකම රු.3,200 ක් වූ ආරක්ෂිත මුද්දර 100 ක් අස්ථාන ගත වී තිබුණු බැවින් එමගින් කාර්යාංශය වෙත රු.320,000 ක ආදායමක් උපයා ගැනීමේ හැකියාව අහිමි වි තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ දී හාලි ඇළ විගමණික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් කාර්යාංශයේ රාජ්‍ය ආයතන සතු අතිරික්ත මුදල් තාවකාලිකව රැස්කිරීමේ අරමුදල යන ගිණුමෙන් රු.57,284,528ක් වැය කර තිබුණු අතර එය ප්‍රතිපූර්ණය කිරීම සඳහා 2015 වර්ෂයේ දී අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබී තිබුණු නමුත් අදාල අරමුදලට එම මුදල් බැර කර නොතිබුණි.

(ආ) 2013 ජනවාරි 24 දිනැති අංක 13/0086/544/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකාවකට අනුව විගමණික සේවකයින් සඳහා නිවාස ආධාර සහ යළි සමානුයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාංශ අරමුදලින් රු.මිලියන 100 ක ස්ථාවර තැන්පතුවක් සමෘද්ධි

බැංකුවේ තැන්පත් කළ යුතු වුවද, ඊට පටහැනිව 2013 මාර්තු 08 දින ලංකා බැංකුවේ සමෘද්ධි අධිකාරීය නමින් පවත්නා බැංකු මූල්‍ය කටයුතු ආයෝජන ගිණුමක එම මුදල තැන්පත් කර තිබුණි. උක්ත තැන්පතුව සඳහා 2013 දෙසැම්බර් 31 දිනෙන් පසු කිසිදු ආයෝජන ආදායමක් කාර්යාංශය වෙත ලැබී නොතිබුණි.

(ඈ) ජාත්‍යන්තර කම්කරු කාර්යාලය සමඟ අනුබද්ධිත ව්‍යාපෘතිය වෙනුවෙන් කාර්යාංශය විසින් දිගුකාලීන ණයහිමියන් යටතේ රු.3,767,965 ක ශේෂයක් ජාත්‍යන්තර කම්කරු කාර්යාලයට ගෙවිය යුතු ලෙස  දක්වා තිබුණ ද කම්කරු කාර්යාලයෙන් ලබාගන්නා ලද ශේෂ තහවුරුව අනුව එවැනි ශේෂයක් ගෙවිය යුතු නොවන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,484,161 ක ශේෂයක් පවතින බව බැංකු වාර්තා අනුව තහවුරු වුවත් එම මුදල සම්බන්ධව කිසිදු විස්තරයක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. කාර්යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල ද මෙම ශේෂය අන්තර්ගත වී නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රත්මලාන පුහුණු මධ්‍යස්ථානය වෙත යතුරු පැදියක් ලබා දී තිබුණද එය ප්‍රයෝජනයට නොගෙන 2015 වර්ෂයේ මුල් මාස 10 තුළ ත්‍රිරෝදරථ කුලී ලෙස රු.72,770 ක් ගෙවා තිබුණු අතර විගණනයේදී සිදුකල නියැදි පරීක්ෂාවට අනුව විගමණික පුහුණු මධ්‍යස්ථාන 7 ක් වෙත ලබාදී තිබූ යතුරු පැදි 9 ක් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

(ආ) මතුගම පුහුණු මධ්‍යස්ථානය සතුව අක්කර 01 ක පමණ විශාල භූමි ප්‍රමාණයක් පවතින අතර එම භූමිය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යාංශය විගමණිකයන් පුහුණු කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කෑගල්ල, පස්යාල, මීගොඩ, කල්මුණේ, මාතර යන ස්ථානවලින් බදු පදනම මත ගොඩනැගිලි ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල එම ගොඩනැගිලි ඌන උපයෝජිතව පැවතීම හේතුවෙන් වසා දමා තිබුණි. කෙසේ වුවද මෙම පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම වෙනුවෙන් වසා දමා තිබූ කාලය තුල බදු කුලී හා නඩත්තු වියදම් ලෙස එකතුව රු.35,249,757 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.

(ඈ) කාර්යාංශය විසින් විගමණිකයින් සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන් කාර්යාංශය සතු ගොඩනැගිලි 03 ක් හා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පුහුණු මධ්‍යස්ථාන හා නේවාසිකාගාර පවත්වාගෙන ගොස් තිබුණි. 2015 ජනවාරි සිට ජුනි දක්වා පුහුණු මධ්‍යස්ථානයන්හි කටයුතු වෙනුවෙන් රු.53,228,410 ක් වැය කර තිබූ අතර ඉන් රු.21,758,076 ක් බදු කුලී ලෙස දරා තිබුණි. එසේ වුවද එම පුහුණු මධ්‍යස්ථාන ඌන උපයෝජිතව භාවිතා කර තිබූ බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) මාතර හා සීදුව නේවාසිකාගාරයන්හි 2015 වර්ෂයේදී කිසිදු පුහුණුලාභියෙකු නේවාසිකව පුහුණුව ලබා නොතිබුණු අතර මඩකලපුව, යාපනය, කෑගල්ල, මාතර, සීදුව, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන පුහුණු මධ්‍යස්ථානයන්හි එක් පුහුණු පාඨමාලාවක් සඳහා පමණක් පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. තවද අනුරාධපුර නේවාසිකාගාරයේ මැයි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ කිසිදු පුහුණුලාභියෙකු නේවාසිකව පුහුණුව ලබා නොතිබූ අතර, බදුල්ල හා අම්පාර නේවාසිකාගාරවල 2015 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පුහුණුලාභීන් 8 ත් 9 ත් අතර ප්‍රමාණයක් පමණක් පුහුණු කිරීම සිදුකර තිබුණි.

(ii) 2015 ජනවාරි සිට ජුනි දක්වා කාලපරිච්ඡේදය තුළ මැදපෙරදිග (දින 07) පුහුණු පාඨමාලාව සඳහා පුහුණු මධ්‍යස්ථාන 04 ක දී වාර 24 කදී පුහුණුලාභීන් 277 දෙනෙකුද, මැදපෙරදිග (දින 21) පුහුණු පාඨමාලාව සඳහා පුහුණු මධ්‍යස්ථාන 17 කදී පුහුණු වාර 145 කදී පුහුණුලාභීන් 2371 දෙනෙකු පුහුණු කර තිබූ අතර මධ්‍යස්ථානවල පුහුණු කර තිබූ සාමාන්‍ය පුහුණුලාභීන් සංඛ්‍යාව 8 සිට 21 දක්වා ඉතා අඩු අගයක් ගෙන තිබුණි.

(iii) 2015 වර්ෂයේ කිසිදු පුහුණුලාභියෙකු නේවාසිකව නොසිටි පුහුණු මධ්‍යස්ථාන 02 ක ඇඳන් 63 ක් ද, මෙට්ට 154 ක් ද වූ අතර නේවාසිකාගාරයක් නොමැති පුහුණු මධ්‍යස්ථාන 04 ක් සඳහා තට්ටු ඇඳන් 36 ක් ද, තනි ඇඳන් 08 ක් ද, යුගල ඇඳන් 24 ක්ද, මෙට්ට 14 ක් ද විය. සමාලෝචිත වර්ෂය තුල එක් පුහුණු පාඨමාලාවක් පමණක් පවත්වා පුහුණුලාභින් 15 දෙනෙකු පමණක් පුහුණුකළ බදුල්ල පුහුණු මධ්‍යස්ථානයේ තට්ටු ඇඳන් ප්‍රමාණයට සාපේක්ෂව මෙට්ට 356 ක අතිරික්තයක් වූ අතර මතුගම විගමණික පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පුහුණු ලාභීන් වෙනුවෙන් දෙනු ලැබූ මදුරු දැල් 83 ක් රැඳවීමේ අපහසුතාවය මත භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

------------------------

දඹුල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩලය විසින් අවලංගු කර තිබූ අතර ඒ සඳහා ගෙවා තිබූ රු.9,878,224 ක උපදේශක ගාස්තු හේතුවෙන් කාර්යාංශයට පාඩුවක් සිදු වී තිබුණි.

## 4.7 ප්‍රසම්පාදන කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------------

රත්නපුර නගරයේ විගමණික සම්පත් පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත රු.394,370,184 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු 2014 අගෝස්තු 28 දින ආරම්භ කර 2015 නොවැම්බර් 29 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපදේශන සේවා ලබා ගැනීමට විවෘත ටෙන්ඩර් පරිපාටියෙන් පුද්ගලික ආයතනයකට රු.13, 840,876 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි.

(i) කාර්යාංශය හා උපදේශන ආයතනය සමඟ 2012 අප්‍රේල් 10 ඇති කර ගත් උපදේශන සේවා ගිවිසුමෙහි 2.29 වගන්තියට අනුව වැඩවල කාර්යසාධනය නිගමනය කිරීම, නියමිත දිනයේ දී ව්‍යාපෘතිය අවසන්කර භාරදීම ආදිය සම්බන්ධයෙන් සේවා සැපයීම උපදේශන ආයතනය විසින් සිදුකල යුතු වුව ද, එම කාර්යයන් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 01 දින වන විට ව්‍යාපෘති කාලයෙන් සියයට 90 ක් අවසන් වී තිබුණද ඉදිකිරීම් කටයුතුවල වැඩ අවසන් කර තිබුණේ සියයට 30 කට ආසන්න ප්‍රමාණයක් පමණි.

(ii) උපදේශන සේවා ගිවිසුමෙහි 1.1.5 වගන්තියට අනුව මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් පිළියෙල කල යුතු වුවද එවැන්නක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) උපදේශන ආයතනය මගින් ඉදිරිපත් කරන ලද අතිරේක වැඩ සඳහා රු.4,499,354 ක් පූර්ව අනුමැතියකින් තොරව කාර්යාංශය විසින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි.

(ඈ) 2014 ජුලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 හි මාර්ගෝපදේශ 2.14.1 ප්‍රකාරව ඉතා හදිසි වූ අවස්ථාවන්හි ප්‍රසම්පාදන කාර්ය පරිපාටියෙන් බැහැරවීම සඳහා ආයතන ප්‍රධානියාට අධිකාරි සීමාව රු.250,000 ක් වුවද ඊට පටහැනිව ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මාසයකට රු,3,366,250 ක් බැගින් මාස 04 ක් සඳහා රු.13,465,000 ක් සහ ඩොන්ගල් හා ප්‍රොජෙක්ටර් මිලදී ගැනීම සඳහා රු.1,133,120 ක් කාර්යාංශයේ සභාපතිවරයා විසින් අනුමත කර ගෙවීම් කර තිබුණි.

(ඇ) කොරියානු රැකියාලාභීන් සඳහා ආහාර පාන සැපයීමේ ගිවිසුම් කාලය ඉකුත්වීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය අනුගමනය කිරීමෙන් නැවත සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කටයුතු කළ යුතු වුවද ඊට පටහැනිව ගිවිසුම් කාලය නිම වුවද වරින්වර ගිවිසුම් කාලය දීර්ඝ කරමින් 2015 ජුනි 13 දින දක්වා ආහාර සැපයීම වෙනුවෙන් පෙර කොන්ත්‍රාත්කරුවන් වෙත සමාලෝචිත වර්ෂයේ දී රු.1,465,255 ක් ගෙවා තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ 2014 ජුලි 04 දිනැති අතිරේක අංක 28 හි 2.14.1 ප්‍රකාරව ඉතා හදිසි වූ අවස්ථාවන්හි ප්‍රසම්පාදන කාර්ය පරිපාටියෙන් බැහැරවීම සඳහා ආයතන ප්‍රධානියාට අධිකාරි සීමාව රු.250,000 ක් දක්වා පමණක් වුවද ඊට පටහැනිව ටී ෂර්ට් 3057 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.3,329,073 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් සභාපතිවරයා විසින් සෘජුවම රජයේ ආයතනයක් මගින් ඉටුකරවා ගන්නා ලෙසට නිර්දේශ කර ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කොන්ත්‍රාත්තුව ලබාදී තිබූ ආයතනය අදාල නොවන ක්ෂේත්‍රයක නියුක්ත ආයතනයක් වූ අතර ඒ හේතුවෙන් කාර්යාංශය විසින් උප කොන්ත්‍රාත්තු ලබාදීමට අවස්ථාව සලසා දීමක් සිදු වී තිබුණි.

(ii) ආයතනය වෙතින් ලබා ගන්නා ලද ටී ෂර්ට් ගුණාත්මක භාවයෙන් තොර බවට ලද පැමිණිලි මත නැවත එම ටී ෂර්ට් ආපසු ලබාගෙන ඒ වෙනුවට නව ටී ෂර්ට් ලබා දීමට සැපයුම්කරු එකඟ වී තිබුණ ද වටිනාකම රු.339,768 ක්වූ ටී ෂර්ට් 312 ක් සඳහා නව ටී ෂර්ට් කාර්යාංශය වෙත විගණන දිනය වූ 2015 ඔක්තෝබර් 02 වන දින තෙක්ම ලබා දී නොතිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 අනුව රු.10,615,826 ක් වටිනා මිලදී ගැනීම් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු පත්කිරීමට අදාල සාමාජිකයන්ගේ පත්වීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවූයෙන් පත්කිරීමේ විධිමත්භාවය විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

(උ) කතරගම විගමණික සම්පත් මධ්‍යස්ථානයක් හා සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ ඉඩම් අත්පත්කරගෙන සැලසුම් සකස් කරමින් තිබූ නමුත් අදාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම හා ප්‍රසම්පාදන කමිටුව පත්කර ගැනීමේ කටයුතු පමණක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණි. එම කාර්ය ප්‍රමාද වීම මත කාර්යාංශය වෙත උපයා ගැනීමට තිබූ ආදායම අහිමි වීමත් හා අමතර කුලී ගෙවීම් මත කාර්යාල පවත්වා ගැනීමට දරනු ලබන වියදමක් අවම කර ගැනීමටත් නොහැකි වී තිබුණි.

**4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති**

---------------------

කාර්යාංශය විසින් රු.26,707,353 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් සැකසීම සඳහා 2015 ජුලි 20 දින බලපත්‍ර ගාස්තුව හා අත්තිකාරම් ලෙස රු.18,052,303 ක් බැගින් බාහිර ආයතන කිහිපයක් වෙත ගෙවා තිබුණි.මේ සඳහා මූල්‍ය උපදේශකවරයෙකුගේ සහාය ලබා ගැනීම වෙනුවෙන් රු.482,333 ක් වැයකර තිබූ අතර 2016 ඔක්තෝබර් මාසය වන විටත් මෘදුකාංගයේ යෝජිත පරිදි භාවිතයට ගැනීමට කාර්යාංශය

අපොහොසත් වී තිබුණි. තවද කාර්යාංශයේ පැවති ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා මාස 08 කින් නිම කිරීමේ එකඟතාවය මත වරලත් ගණකාධිකාරී ආයතනයකට රු.2,100,000 ක් 2015 මාර්තු 17 දින, ප්‍රදානය කර තිබූ නමුත් 2016 මැයි 31 වන විටත් මෙම කාර්යය අවසන් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර ගිවිසුමකටද එළඹ නොතිබුණි.

**4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්**

**------------------------------------------------------------------**

කාර්යාංශයට අයත් නිලධාරීන් 03 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළ දී සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණි.

**4.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

**-------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට අදාලව කාර්ය මණ්ඩල විස්තර පහත සඳහන් පරිදි වේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ 1230 ක ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද තථ්‍ය කාර්ය මණ්ඩලය 1001 ක් වීමෙන් කාර්යය මණ්ඩලයේ 229 ක පුරප්පාඩු නිරීක්ෂණය වූ අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත රියදුරන් 20 දෙනෙකු හා කාර්යාල කාර්ය සහයකයින් 31 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු අනුමත කර වසර 5 ක් ගතවී ඇති තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 44 දෙනෙකු සහ සමාලෝචිත වර්ෂය තුළ පුරප්පාඩු තනතුරු 72 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කාර්යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 168 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණු අතර 2015 දෙසැම්බර් 08 දිනැති අංක ඩීඑම්එස් /1727 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට පටහැනිව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගෙන තිබූ කොන්ත්‍රාත් සේවකයන් 34 ක් සඳහා බඳවා ගත් දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා එකතුව රු.6,606,000 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. තවද උක්ත ලිපියට අනුව අන්තර් දීමනාව සඳහා කොන්ත්‍රාත් සේවකයෙකුට හිමිකම 2015 ජුනි 01 වන දින සිට ක්‍රියාත්මක බව සඳහන් වී තිබූ අතර 2015 වර්ෂයේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සියළුම සේවකයන්ට 2015 ජුනි 01 දිනට පෙර සිටම එනම් සේවයට බැඳුණු දින සිටම අන්තර් දීමනා ලෙස එකතුව රු.210,000 ක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) අනුමත නොවූ තනතුරක් වූ ගුවන් ටිකට්පත් විධායක තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු 2012 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.4,345,058 ක් හා සමාලෝචිත වර්ෂයේදී එක් නිලධාරියෙකු වෙනුවෙන් රු.590,400 ක් ද ගෙවා තිබුණි.

(ඉ) 2015 මැයි 22 දින කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 109 දෙනෙක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 අභ්‍යන්තර විගණනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශය විසින් පෙර වර්ෂයේ විගණන වාර්තා මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු කාර්යාංශය විසින් නිවැරදි නොකිරීම නිසා ඊට පසු වර්ෂයේදී ද එම අඩුපාඩු වාර්තා වල දක්වා තිබුණු බව දූත මණ්ඩල 02 කට අදාලව නිකුත් කරන ලද වාර්තා පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ආ) අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්යසාධනය පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කාර්යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් 2015 වර්ෂයේ සැලසුම්ගත ක්ෂේත්‍ර 59 න් ක්ෂේත්‍ර 13 ක් පිළිබඳව පමණක් අවධානය යොමු කර තිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් තම ඉලක්කගත අරමුණෙන් සියයට 78 ක ප්‍රමාණයක් පමණක් ළඟාකරගෙන නොතිබුණි.

(ii) ආවරණය කර තිබූ ක්ෂේත්‍ර සඳහා සැලැස්මේ වෙන් කර තිබූ මිනිස් දින ප්‍රමාණය 530 ක් විය. එය සමස්ථ කාර්ය මණ්ඩලයට හිමි මිනිස් දින 3388 න් සියයට 16 ක ප්‍රමාණයක් පමණක් විය.

(iii) සමාලෝචිත වර්ෂයේ දී කාර්යාංශය විසින් ප්‍රාග්ධන වියදම් සඳහා රු.299,220,355 ක් වැය කර තිබුණු අතර ඉන් රු.271,784,451 ක් ඉදිකිරීම් සඳහා වැය කර තිබුණි. සමස්ථ ප්‍රාග්ධන වියදමින් සියයට 91 ක් වූ එම ඉදිකිරීම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ඒකකය අවධානය යොමුකර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

---

2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වියදම් විෂයන් 04 ක සියයට 122 සිට සියයට 213,703 ක් දක්වා වැඩිවීම් සහ වියදම් විෂයයන් 03 ක සියයට 84 සිට සියයට 99 දක්වා වියදම් අඩුවීම් නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

---

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මීට පෙර වාර්තා මගින් කාර්යාංශය දැනුවත් කර තිබූ නමුත් එම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය විය.

(අ) විදේශ රැකියා පිළිබඳ දැනුවත් කිරීම සඳහා කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල පවත්වන ලද පා ගමන් සඳහා එකක් රු.192 ක් වූ ගෑස් පිරවූ බැලුන් 3000 ක් හා එකක් රු.11,652 ක් වටිනා බැනර් 30 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.925,304 ක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් ක්‍රමවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. තවද උක්ත ගෙවීම්වලට අදාලව ඉදිරිපත් කර තිබූ ලේඛන පිළිගත නොහැකි වූ අතර මිලදී ගැනීම් විධිමත් පරිදි කාර්යාංශ ගබඩාව හරහා සිදු කර නොතිබීමෙන් එම භාණ්ඩ කාර්යාංශයට ලැබුණු බවට ද සාක්ෂි නොවීය.

(ආ) 2014 මැයි 09 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදේශ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීමේ ප්‍රචාරක කාර්යය වෙනුවෙන් 2014 වර්ෂයේදී රු.1,713,600 ක් සැලසිනේ ආයතනයට ගෙවා තිබුණද මෙවැනි වැඩසටහනක් පැවැත්වූ බවට සනාථ වන කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) හාලි ඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානයට මුල්ගල තැබීමේ උත්සවයේ වියදම් වෙනුවෙන් රු.12,612,500 ක් සභාපති විසින් අනුමත කර තිබුණු අතර එම මුදලින් රු.9,157,060 ක් වැය කර ඇති බව දක්වා තිබුණද ඉන් රු.8,048,648 ක් උක්ත කාර්යයට යොදවා නොතිබුණි. තවද මූල්‍ය බලතල පැවරීම සම්බන්ධයෙන් මු.රෙ.135 හා 2014 පෙබරවාරි 20 දිනැති අංක 20.11.15 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සභාපතිගේ මූල්‍ය බලතල සීමාව රු.2,000,000 කට සීමාවී තිබුණද රු.12,612,500 ක වියදම් ඇස්තමේන්තුවක් සභාපතිවරයා විසින් අනුමත කර තිබූ අතර 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පරිපාටීන් අනුගමනය කිරීමකින් තොරව මෙම වියදම් දරා තිබුණි.

(ඈ) 1981 අංක 15 දරන ජනාධිපතිවරයා පත්කර ගැනීම පිළිබඳ පනත හා මැතිවරණ කොමසාරිස්වරයාගේ 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/015/43දරන ලිපියට පටහැනිව බදුල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල රටවිරු සංවිධාන බල ගැන්වීමේ වැඩසටහන් 2014 දෙසැම්බර් 01 සිට 2015 ජනවාරි 31 දින දක්වා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කාර්යාංශ සේවයේ නියුක්ත නිලධාරීන් 116 දෙනෙකු බදුල්ල පළාත් කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. එම වැඩසටහන් සඳහා එම කාලය වෙනුවෙන් නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස රු.4,314,110 ක් හා කුළී පදනම මත වාහන 10 ක් සැපයීම සඳහා කුලී ගාස්තු ලෙස රු.5,125,824 ක් වශයෙන් එකතුව රු.9,439,934 ක් වැය කර තිබුණද අරමුණුගත කාර්යය සිදු වී නොතිබුණි.

(ඉ) නාය යෑමෙන් විපතට පත් මීරියබැද්ද, කොස්ලන්ද ප්‍රදේශයේ රටවිරු පවුල්වලට සහන සැලසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල පූර්ව අනුමැතියකින් තොරව රු.1,000,000 ක් බදුල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරි වෙත බැංකු අණකරයකින් ගෙවා තිබුණි.

(ඊ) 2011 හා 2012 වර්ෂවලට අදාලව ජාතික රක්ෂණ අරමුදල් භාරයට හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති නියෝජිත ආයතනය වෙත රක්ෂණ වාරික මුදල් ලෙස ගෙවා තිබූ රු.218,681,760 ට අදාල රු.23,430,210 ක් වූ යෙදවුම් බදු මුදල්, ආපසු ගෙවීම් ගණනය කිරීමේදී, අදාල කර නොගැනීම හේතුවෙන් කාර්යාංශය එම ප්‍රමාණයෙන් බදු වැඩියෙන් ගෙවීම් කර තිබුණි. වර්ෂයක කාල සීමාව ඉක්මවා ඇති බැවින් එම මුදල් ආපසු ඉල්ලුම් කල නොහැකි වී තිබූ අතර එම අලාභය සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(උ) වැඩ අවසන්කර කාර්යාංශය වෙත භාර දී ඇති තංගල්ල විගමනික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ගෙවන ලද රු. 58,549,800 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලේ ඇතුළත් රු.5,635,915ක් වූ වැට් බදු, ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර යෙදවුම් බදු ලෙස ආවරණය කර ගැනීමට කටයුතු නොකිරීමෙන් එම ප්‍රමාණයෙන් අලාභයක් සිදුවී තිබුණි.

(ඌ) අබුඩාබිහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශයේ කම්කරු ලිපිකරු නිලධාරිනිය විසින් 2014 ජුනි 03 සිට 2014 ජුනි 09 දින දක්වා වූ කාල සීමාව තුළදී රැස්කරගන්නා ලද AED 29,295 ක් වූ (ආසන්න ලෙස රු.1,058,276 ක් වූ) මුදල , මු.රෙ.187(3) ප්‍රකාරව අප්‍රමාදව බැංකු ගත කිරීමට කටයුතු නොකිරීම හා එම ප්‍රමාණයෙන් කම්කරු සුභසාධන අංශයේ මුදල් හිඟයක් පැවතීම සම්බන්ධයෙන් විධිමත් පියවරක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි. උක්ත කාරණය සම්බන්ධයෙන් මු.රෙ.165(1) ප්‍රකාරව ලැබෙන මුදල් නියමිත ආකාරයට ගිණුම් පොත් පත්

වල ඇතුළත්කර විධිමත් ක්‍රියාමාර්ගයන් ගනු ලබන බවට වගබලා ගැනීම, කාර්ය භාර මාණ්ඩලික නිලධාරියාගේ කාර්යය බව අවධාරණය කර තිබියදී ඉන් බැහැර වීම හා විධිමත් පරිදි අදාල පොත් පත් ලේඛන භාර දිමත් සිදු නොකර එම නිලධාරිනිය සුභ සාධන අංශයෙන් නිදහස් කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) කාර්යාංශයේ ආදායම් වියදම් විධිමත් පරිදි ගිණුම් පොත්පත්වලට ඇතුළත් නොකිරීම.<br>(ii) විදේශ දූත මණ්ඩල මගින් උපයා ගනු ලබන ආදායම් රැස්කර ගැනීම් හා ඵලදායී ලෙස විගමණික ශ්‍රමිකයන්ට එම මුදලින් සේවාවන් සැපයීම සඳහා ප්‍රයෝජනයට ගැනීම. |
| (ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිලදී ගැනීම් ක්‍රියාවලිය. |
| (ඇ) වාහන පාලනය | කාර්යාංශයේ ප්‍රයෝජනයට ගනුලබන වාහනවල ඉන්ධන දහනය හා වාහන පරිපාලනය. |
| (ඈ) භෞතික හා මානව සම්පත් පාලනය | (i) විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම.<br>(ii) කාර්යාංශය සතු භෞතික හා මානව සම්පත් පාලනය හා උපයෝජනය. |
| (ඉ) ගබඩා පාලනය | කාර්යාංශය විසින් උප පත්‍රිකා පොත් නිසි පරිදි සුරක්ෂිතව තැන්පත් කර නොතිබීම. |